SLECIC

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

## 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) HM 1-3 - තනතුරු 01

**බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අලෙවිකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, වාණිජ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධියක්.

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Master's Degree) හෝ තනතුරට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය.

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 15ක "කළමනාකරණ මට්ටමේ" පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 02 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සනාථ කළ හැකි වාර්තා සහිතව තිබිය යුතුය.

**හෝ**

2. තනතුරට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සමාජිකයෙකු (Fellow/Full Membership) වීම.

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 15 ක "කළමනාකරණ මට්ටමේ" පළපුරුද්ද.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය පථය යටතේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM) ශ්‍රේණියේ තනතුරක වසර දෙකක (02) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව බලනොපායි.

**වැටුප** : HM 1-3 රු.[ 152,500 - 15 x 4,100 - 214,000] (MSD චක්‍රලේඛ 01/2025 ට අනුව) + ජීවන වියදම් + වෘත්තිය දීමනා + KPI දිරි දීමනා + වෛද්‍ය පහසුකම් + සංස්ථාව විසින් නඩත්තු කෙරෙන වාහනයක් හෝ වාහන දීමනාව + ඉන්ධන දීමනා සහ චක්‍රලේඛයන්ට අනුව අනෙකුත් අනුමත දීමනා.

## 02. කනිෂ්ඨ කළමනාකරු (අලෙවිකරණ) JM 1-2 (II ශ්‍රේණිය) – තනතුරු 01

**බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අලෙවිකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, වාණිජ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධියක්.

**හෝ**

2. තනතුරට අදාළ විෂය පථයන්ගෙන් සමන්විත පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගයෙන් සමත්ව තිබීම

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය පථයෙහි, 'කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන' (MA1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා අදාළ නොවේ.

**වැටුප** : JM 1-2 රු. [74,010-10X1,360-18X2,040-124,330] (01/2025 දරන MSD චක්‍රලේඛයට අනුව) + ජීවන වියදම් දීමනාව + සන්නිවේදන දීමනාව + KPI දිරි දීමනා + වෛද්‍ය පහසුකම් සහ චක්‍රලේඛ අනුව අනුමත අනෙකුත් දීමනා.

## 03. කනිෂ්ඨ කළමනාකරු (හිමිකම් සහ අයකර ගැනීම්) JM 1-2 (II ශ්‍රේණිය) – තනතුරු 01

**බාහිර අපේක්ෂකයින්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, වාණිජ, ගිණුම්කරණය, මූල්‍ය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය පථයෙහි, 'කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන' (MA1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා අදාළ නොවේ.

**වැටුප** : JM 1-2 රු. [74,010-10X1,360-18X2,040-124,330] (01/2025 දරන MSD චක්‍රලේඛයට අනුව) + ජීවන වියදම් දීමනාව + KPI දිරි දීමනා + වෛද්‍ය පහසුකම් සහ චක්‍රලේඛ අනුව අනුමත අනෙකුත් දීමනා.

## 04. කනිෂ්ඨ කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන) JM 1-2 (II ශ්‍රේණිය) – තනතුරු 01

**බාහිර අපේක්ෂකයින්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය (HRM), ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය (මානව සම්පත්), රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, වාණිජ හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය පථයෙහි, 'කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන' (MA1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා අදාළ නොවේ.

**වැටුප** : JM 1-2 රු. [74,010-10X1,360-18X2,040-124,330] (01/2025 දරන MSD චක්‍රලේඛයට අනුව) + ජීවන වියදම් දීමනාව + KPI දිරි දීමනා + වෛද්‍ය පහසුකම් සහ චක්‍රලේඛ අනුව අනුමත අනෙකුත් දීමනා.

## 05. සාමාන්‍යාධිකාරීවරයාගේ පෞද්ගලික සහකාර MA 1-2 (III ශ්‍රේණිය) – තනතුරු 01

**බාහිර අපේක්ෂකයින් (පහත 1, 2 සහ 3 සුදුසුකම් සපුරා තිබිය යුතුය)**

1. එක් වරකදී විෂයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්ව තිබීම සහ පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ලබා තිබීම:
   - i. සිංහල / දෙමළ
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය
2. අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් (පොදු සාමාන්‍ය පරීක්ෂණය හැර) විෂයන් තුනක් (03) සමත්ව තිබීම.
3. ලේකම් වෘත්තිය (Secretarial Practice) පිළිබඳ NVQ 3 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ නොපුහුණු කාණ්ඩවල සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

**අධ්‍යාපනික :**

පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්ව තිබීම:

- i. සිංහල / දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා අදාළ නොවේ.

**වැටුප** : MA 1-2 රු. [46,220 -10 x 540 – 7x630-12x1,080-12x1,280-84,350] (01/2025 දරන MSD චක්‍රලේඛයට අනුව) + ජීවන වියදම් දීමනාව + KPI දිරි දීමනා + වෛද්‍ය පහසුකම් සහ චක්‍රලේඛ අනුව අනුමත අනෙකුත් දීමනා.

**සාමාන්‍ය කොන්දේසි**

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීම සඳහා කායිකව සහ මානසිකව නිරෝගී විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් හෙබි විය යුතුය.

උනන්දුවක් දක්වන අපේක්ෂකයින් නිල වෙබ් අඩවියට (https://www.slecic.lk/web/index.php/en/) පිවිස ඉහත තනතුරු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, තේරී පත්වුවහොත් සේවයෙන් මුදා හැරීමේ හැකියාව පිළිබඳවද එහි සඳහන් කළ යුතුය.

ඉහත තනතුරු සඳහා වන අයදුම්පත්, අදාළ සහතිකවල ඡායා පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සමග, "සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 04 වන මහල, NDB-EDB කුලුන, අංක 42, නවම් මාවත, කොළඹ 02" යන ලිපිනයට 2026 ජූනි මස 05 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.